# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,368 - 2024 ජනවාරි මස 19 වැනි සිකුරාදා - 2024.01.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම් ... ... ... | 18 |
| මුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 26 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2024 පෙබරවාරි 09 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2024 ජනවාරි මස 26 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර) තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**206 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

17 - B 082533 — 353 (2024/01)
D 1 -

# පිස්කල් විකිණීම්

## කොළඹ වාණිජ මහාධිකරණයේ දී ය

## පිස්කල් මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

එලායන්ස් ෆිනෑන්ස් කම්පැණි පීඑල්සී,
අංක 84, වෝඩ් පෙදෙස, කොළඹ 07.

*නඩු අංකය* : HC/CIVIL/300/2018/MR
*ඇස්කිසි අංකය* : 38/22
*ස්වභාවය* : උකස්
*ක්‍රියා පටිපාටිය* : සාමාන්‍ය
*වටිනාකම* : රු. 13,611,198.86

....................*පැමිණිලිකරු.*

*එදිරිව*

දෙගිරි ගයාශාන් මෙන්ඩිස්,
අංක 106, මෙන්ඩිස් ගොඩනැගිල්ල,
නව නගරය පාර, ඇඹිලිපිටිය.

.....................*විත්තිකරු.*

වර්ෂ 2019ක් වූ ඔක්තෝබර් මස 24 වැනි දින මෙම නඩුවට ඇතුළත් ලබා දෙන ලද සමථ තීන්දු ප්‍රකාශය අනුමත වී ඇති හෙයින් එම තීන්දු ප්‍රකාශය අනුව,

පැමිණිල්ලේ පළමුවන නඩු නිමිත්ත සම්බන්ධයෙන් රුපියල් එක්කෝටි තිස් හය ලක්ෂ එකොළොස් දහස් එකසිය අනූ අටයි ශත අසූ හයක (රු. 13,611,198.86) මුළු මුදල වර්ෂ 2017.08.02 දින දක්වා ඒ මත පොළිය ද, සම්පූර්ණයෙන් ගෙවා නිම කරන ලෙස අණ කොට තීන්දු ප්‍රකාශ කරනු ලැබ ඇති හෙයින් ද,

පැමිණිල්ලේ දෙවන නඩු නිමිත්ත සම්බන්ධයෙන් රුපියල් එක්කෝටි තිස් හය ලක්ෂ එකොළොස් දහස් එකසිය අනූ අටයි ශත අසූ හයක (රු. 13,611,198.86) යන මුදල හා නෛතික පොළිය පියවීමේ සුරක්ෂිතයක් ලෙස පැමිණිලිකරු වෙත ලබා දී ඇති ඉහත ප්‍රසිද්ධ නොතාරිස් අචල වන්නිආරච්චි මහතා නීතිය ඉදිරියේ ක්‍රියාත්මක කරන ලෙස අණකොට තීන්දු ප්‍රකාශ කරනු ලැබ ඇති හෙයින් ද,

ප්‍රසිද්ධ නොතාරිස් අචල වන්නිආරච්චි මහතා විසින් ලියා සහතික කළ වර්ෂ 2016ක් වූ ජනවාරි මස 21 වැනි දිනැති අංක 28 දරන උකස්කරය යටතේ සහ ඒ ප්‍රකාරව ඉහත සඳහන් මුදල් අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයෙහි විස්තර කර ඇති මුළු ඉඩම් කොටස ද, ඒ මත පිහිටා ඇති ගොඩනැගිලි ද, ඒවාට අයත් හෝ අනුබද්ධ කවර අන්දමේ වුව සියළු අයිතිවාසිකම් ද, එකී ඉඩමට අදාලව එහි තුළ හෝ එයින් හෝ ඒ ඇතුළත ද වන විත්තිකරුගේ කවර අන්දමේ වුව සියලුම බූදලය, අයිතිය, හිමිකම දේපල හිමිකම් පෑම සහ ඉල්ලීම බන්ධිත වී සහ රිට් ආඥාවකට යටත් බවත් ඉහත සඳහන් මුදල් අයකර ගැනීම සඳහා උකස් බැඳුම්කරය බලාත්මක කිරීමට පැමිණිලිකරුට හිමිකම් ඇති බවටත් ප්‍රකාශයක් කරමින් ගෙවන ලෙස අණකොට තීන්දු ප්‍රකාශ කරනු ලැබ ඇති හෙයින් ද,

තීන්දු කරනු ලබන ඉහත කී පොළිය සහ ගාස්තු ගෙවීම, තීන්දු ප්‍රකාශ කරන ලද දිනයේ සිට මාස දෙකක් ඇතුළත පැහැර හැරීමේ දී මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති එකී ඉඩම සහ පරිශ්‍රය ආණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි සහ අවම වශයෙන් දේශීය ප්‍රවෘත්ති පත්‍ර දෙකක නිසි පරිදි ප්‍රසිද්ධ කිරීමෙන් පසු වෙන්දේසිකරු කල්පනාකරන සහ අධිකරණය විසින් අනුමත කරනු ලබන විකිණීමේ කොන්දේසි පිළිබඳව එවන් ප්‍රසිද්ධ කිරීමෙන් පසුව අධිකරණය විසින් පත් කරනු ලබන වෙන්දේසිකරුවකු විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ දී විකුණනු ලැබීමටත් එකී වෙන්දේසිකරුට පහත දැක්වෙන සේ විධානය කරනු ලැබීමටත් ගෙවන ලෙස අණකොට තීන්දු ප්‍රකාශ කරනු ලැබ ඇති හෙයින් ද,

(i) සංශෝධිත පරිදි වූ 1949 අංක 06 දරන උකස් පනතේ 52(1) වන වගන්තිය යටතේ දක්වා ඇති පරිදි පවත්නා වෙළඳපොළ වටිනාකමට මුල් අවස්ථාවේ දී ද, මෙහි උපලේඛනයේ විස්තර කර ඇති එකී ඉඩම සහ දේපල විකිණීමට ඉදිරිපත් කරන ලෙසත්, එකී අගය මත ලංසු නොතබන්නේ නම් තීන්දු ප්‍රකාශය යටතේ නියමිත මුදල් ප්‍රමාණය ලෙස දැන්වීම් වල දී ඇති තක්සේරු කළ අගයට ද, එවන් විකිණීමේ දී ලංසු තබන්නන් නොමැති විට, එවැනි අවස්ථාවේ දී මෙහි උපලේඛනයේ විස්තර කර ඇති එකී ඉඩමට සහ දේපල විකිණීමට ඉදිරිපත් කරන ලෙසත්, එකී අගය මත ලංසු නොතබන්නේ නම් තීන්දු ප්‍රකාශය යටතේ නියමිත මුදල් ප්‍රමාණය ලෙස දැන්වීම්වල දී ඇති තක්සේරු කළ අගයට ද, එවන් විකිණීමේ දී ලංසු තබන්නන් නොමැති විට එවැනි අවස්ථාවේ දී ඒ එක්කම තිබෙන ඉහලම ලංසුවට විකිණීමටත්,

(ii) පැමිණිලිකරු හෝ ඒ වෙනුවෙන් වෙනත් කිසිවෙකුටත්, එකී උකස් කරන ලද දේපල සඳහා ලංසු තබා මිලදී ගැනීමට ඉඩ දෙන ලෙසත්,

එවන් විකිණීමක දී ඔහු හෝ ඇය විකිණීමේ කොන්දේසිවලට අනුකූලව ක්‍රියාකර සහ පැමිණිලිකරුට ඔහුගේ හිමිකම් පෑමේ සහ ගාස්තු ප්‍රමාණයට අඩු කිරීම් වලට ඉඩදී ඇති බවට පැමිණිලිකරු මිලදීගැණුම්කරු වූ බවට තෘප්තිමත් වුවහොත් මිල දී

ගැණුම්කරුගේ නමින් නිසි ආකාරයට අවශ්‍ය ඔප්පු යනාදිය සාධනය කර දීමටත්, මිල දී ගැණුම්කරු තුන්වන පාර්ශවයක් වුවහොත් මිල දී ගැණුම් වටිනාකම අධිකරණයේ තැන්පත් කරනු ලැබීමටත් වෙන්දේසිකරුට හෝ අධිකරණය විසින් බලය දෙනු ලැබූ වෙනත් තැනැත්තෙකුට විධානය කරමින් ගෙවන ලෙස අණකොට තීන්දු ප්‍රකාශ කරනු ලැබ ඇති හෙයින් ද,

මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති ඉඩම සහ පරිශ්‍රයේ හිස් බුක්තිය ගැණුම්කරුට භාරදෙන ලෙසට ඇඹිලිපිටිය දිසා අධිකරණයේ රෙජිස්ට්‍රාර්/පිස්කල් නිලධාරියාට නියම කරමින් ගෙවන ලෙස අණකොට තීන්දු ප්‍රකාශ කරනු ලැබ ඇති හෙයින් ද,

තව ද, අධිකරණයේ නිලධාරියෙකු විසින් තක්සේරු කරනු ලබන මෙම නඩුවේ නඩු ගාස්තු ප්‍රදනය කරමින් ගෙවන ලෙස අණකොට තීන්දු ප්‍රකාශ කරනු ලැබ ඇති හෙයින් ද, රුපියල් 14,510,000/- ක මුදලින් කෙසේ වෙතත් දෙපාර්ශවය අතර 2019.10.24 වැනි දින ඇති වූ සමථ තීන්දු ප්‍රකාශය අනුව 2023.08.23 වැනි දිනට රු. 7,253,037.00 මුදලක් පමණක් ගෙවා ඇත. එබැවින් එකී තීන්දු ප්‍රකාශයට අනුකූලව සහ මෙම අධිකරණයේ විකිණීමේ කොන්දේසි අනුමත කිරීමෙන් පසුව පැමිණිල්ලේ උපලේඛනයේ දක්වා ඇති ඉඩම සහ එහි පිහිටි ගස්කොළ සහ ඊට අනුබද්ධිත සියළු දේ විත්තිකරුවන්ට ඇති කවර හෝ අයිතිවාසිකම් ද හිමිකම් සම්බන්ධයෙන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා මෙම අධිකාරී පත්‍රයේ මෙම අධිකරණය විසින් ඔබව පත්කර සංස්ථාපනය කරඇති හෙයින් මෙම දේපළවලට පිවිස තීන්දු ප්‍රකාශයේ උපලේඛනයේ විස්තර කර ඇති ඉඩම සහ දේපළ එහි සඳහන් නියමයන් සහ කොන්දේසි මාලාව අනුමත කිරීමෙන් පසු ඒවා පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන ලෙසටත් පහත සඳහන් පරිදි ක්‍රියාත්මක කිරීමටත් මෙයින් නියෝග කර බලය පවරනු ලැබේ.

ප්‍රථමයෙන් එකී දේපළ තක්සේරු අගයකට වෙන්දේසි කිරීම සඳහා ඉදිරිපත් කරන ලෙසත්, එම අගයට ලංසු තබා ඉල්ලුම් කරන්නන් නොසිටියහොත් කොමිසම නිකුත් කරන අවස්ථාව වනවිට තීන්දු ප්‍රකාශයේ සඳහන් මුදලට විකිණීමට ඉදිරිපත් කරන ලෙසත්,

එම වෙන්දේසියේ දී එය වෙනුවෙන් අන්‍ය පුද්ගලයෙකුට ලංසු තබා ඉල්ලුම් කොට මිල දී ගැනීමට අවසර දෙන ලෙසටත්, තව ද, ගැණුම්කරු පැමිණිලිකරු වුවහොත් වෙන්දේසියේ කොන්දේසි සපුරනු ලදුව, පැමිණිලිකරුගේ හිමිකම්පෑමේ හා ගාස්තු මත ප්‍රමාණයට පැමිණිලිකරුට බැර සලසා දී හා ගැණුම්කරු තුන්වන පාර්ශවයක් වන්නේ නම්, ගැණුම් මිල අධිකරණයේ තැන්පත් කර ඇති බවට සෑහීමකට පත්වීමෙන් පසුව එම වෙන්දේසියේ ගැණුම්කරු නමින් නීති ප්‍රකාර නිසි ආකෘතියේ වූ නිසි පැවරුම්කරයක් ලියා අත්සන් කරන ලෙස එම වෙන්දේසිකරුට හෝ අධිකරණය මගින් බලය පවරා දෙනු ලැබූ අන්‍ය පුද්ගලයෙකුට නියම කරන ලෙසත්,

එම වෙන්දේසියේ දී දේපළ මිල දී ගත් පුද්ගලයාට එකී භුක්තිය භාරදීම ඇඹිලිපිටිය දිසා අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාට පිස්කල්ට නියම කරන ලෙසත්,

තව ද, උකස් දේපළ වෙන්දේසිය පිළිබඳව දැන්වීම් වෙන්දේසියේ දිනට යටත් පිරිසෙයින් දින 20කට කලින් ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට්* පත්‍රයේ ද, එක් දිනෙක සිලෝන් ඩේලි නිව්ස් පුවත්පතේ ද, එදිනට දිනමිණ හා තිනකරන් පුවත්පත්වල පල කිරීමට සහ වෙන්දේසියට යටත් පිරිසෙයින් දින 10කට කලින් වෙන්දේසිය පිළිබඳ දැන්වීම්, ඉංග්‍රීසි, සිංහල සහ දෙමළ භාෂාවෙන් අධිකරණ රෙජිස්ට්‍රාර් කාර්යාලයේ හෝ මෙම අධිකරණයේ හෝ උකස් කළ දේපළෙහි ඇති තාප්පයක, ගොඩනැගිල්ලක ප්‍රකටව පෙනෙන තැනක ඇලවීම මගින්, වෙන්දේසි කරන අවස්ථාවක දී සීනු හැඬවීම සහ බෙර ගැසීම මගින් ප්‍රචාරය කිරීමට ද,

තව ද, 1949 අංක 06 දරන උකස් ආඥා පනතේ 53(1) විධිවිධාන වලට අනුව උකස් කළ දේපළ වෙන්දේසියට තැබීම සහ වෙන්දේසියේ ගැණුම්කරුවන් විකිණීමේ කොන්දේසිවලට අනුකූලව ක්‍රියා කළ විට සහ විකිණීම ස්ථිර කරමින්, අධිකරණය විසින් කරන ලද ආඥාවක් ඉදිරිපත් කළ විට, උකස්කළ දේපළ පිළිබඳව අවශ්‍ය හිමිකම් ඔප්පු ගැනුම්කරුවන්ගේ හෝ ගැනුම්කරුගේ නමට ලියා අත්සන් කරන ලෙසට,

තව ද, විකිණීමෙන් ලැබිය යුතු මුදල, පොලිය සහ නඩු ගාස්තු ගෙවීමට ඒ සඳහා යොදන ලෙසට ද,

තව ද, එම වෙන්දේසියේ දී මෙම අධිකරණය විසින් නිසි ලෙස සහතික කර අත්සන් තබන ලද ලංසු තබා මිලට ගැනීමේ නියෝගයෙන් සහ බැර සහනයක් ලබා දීමේ නියෝගයක් ඉදිරිපත් කරන ලද හොත් එම තීන්දු ප්‍රකාශයෙන් සහ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති ඉඩම සහ ස්ථානය එකී පිහිටි ගොඩනැගිලි සහ ඒවාට විත්තිකරුවන්ට ඇති කවර හෝ අයිතිවාසිකම් සම්බන්ධයෙන් පැමිණිලිකරුට හෝ ඒ වෙනුවෙන් වෙනත් අයෙකුට ලංසු තබා මිල දී ගැනීමේ නියෝගයක් සහ බැර සහනයන් ලබා දීමේ නියෝගයක් ඉදිරිපත් කරන ලද හොත් එම තීන්දු ප්‍රකාශයේ ඉඩම/ස්ථානය එහි පිහිටි ගොඩනැගිලි සහ ඒවාට විත්තිකරුවන්ට ඇති කවරම හෝ අයිතිවාසිකම් සම්බන්ධයෙන් පැමිණිලිකරුට හෝ ඒ වෙනුවෙන් වෙනත් අයෙකුට ලංසු තබා මිල දී ගැනීමට ඉඩ හරින ලෙසත්, පැමිණිලිකරුගේ මුදල් අමතර පොළිය සහ නඩු ගාස්තුවේ ප්‍රමාණයට එයට බැර සහනයක් ලබා දෙන ලෙසට ද, ඔබට මෙයින් වැඩිදුරටත් නියෝග කරනු ලැබේ.

තව ද, වෙන්දේසියේ දී ලබාගත් මුදලින් 25% එම වෙන්දේසිය පවත්වා පැය 48 ක් ඇතුළත ඔබ විසින් මෙම අධිකරණයේ තැන්පත් කළ යුතු අතර, එම වෙන්දේසියෙන් ලිත් මසක් ඇතුළත ඉතිරි 75%ක මුදල ගෙවිය යුතු අතර, එම වෙන්දේසියේ සිට සතියක් ඇතුලත හෝ 2024 ක් වූ සැප්තැම්බර් මස 04 වැනි දින හෝ කොයියම් දිනයක සතියක් ඉක්ම යාමට පෙර විකුණන ලද දේපළ වෙන් වෙන් වශයෙන් විකුණුම් මිල දර්ශනයන් පෙන්නුම් කරන සියළුම විස්තර සහිත වාර්තාව සහ ලියා සහතික කරන ලද විකිණීම් කොන්දේසිකරුවන් විසින් සහතික කරන ලද්දේදැයි දන්වා සිටිය යුතු බවටත්, දන්වා තීන්දු ප්‍රකාශ කොට ඇත.

එකී තීන්දු ප්‍රකාශය අනුව ගෙවීම් කිරීමට විත්තිකරු අපොහොසත් වී පැහැර හැර ඇති බැවින්, එකී අධිකරණයෙන් මා වෙත ලැබී ඇති ඇස්කීසි බලපත්‍රයේ බලය පිට ඇඹිලිපිටිය දිසා අධිකරණ රෙජිස්ට්‍රාර්වරයා විසින් 2022.09.01 වැනි දින තහනමට ගෙන ඇති ඉහත නම් සඳහන් විත්තිකරුට අයත් පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති නිශ්චල දේපළ,

**වර්ෂ 2024ක් වූ පෙබරවාරි මස 13 වැනි දින ප. ව. 12.30ට** ඉහත නම් සඳහන් විත්තිකරුගේ උපලේඛනයේ සඳහන් නිශ්චල දේපළ පිහිටි අංක 106, මෙන්ඩිස් ගොඩනැගිල්ල, නව නගරය පාර, ඇඹිලිපිටිය දරන ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

### උපලේඛනය

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කොලොන්න කෝරළේ, දියපොටගම් පත්තුවේ, ඇඹිලිපිටිය නගර සභා සීමාව තුළ, නව නගරය ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, ඇඹිලිපිටිය-පල්ලේගම ග්‍රාමයේ, ''කොලොන්ගස්යාය'' නැමති ඉඩම බලයලත් මිනින්දෝරු එච්. එස්. මුණසිංහ විසින් මැන සාදන ලද අංක 2013/99 සහ 2013/07/10 දින දරන පිඹුර ප්‍රකාර ලොට් අංක ඒ කැබැල්ලට මායිම් : උතුරට : වැව් අතුරේ පාර ද, නැගෙනහිරට : දෝන ශ්‍රියාණි විමලසූරියට අයත් ඉඩම ද, දකුණට : ප්‍රධාන පාර ද, බටහිරට : ඇඹිලිපිටිය තරුණ සේවා සභාවට අයත් ඉඩම යන මායිම් වූ ප්‍රමාණයෙන් පර්චස් එකොළහයි දශම හතරයි හතක (පර්. 11.47) විශාලත්වය ඇති ඉඩම සහ ඒ තුළ පිහිටි ගහකොළ සහ සියලු දේ ද වේ. (මෙය ඇඹිලිපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ L95/32 හි ලියාපදිංචි වී ඇත.)

*ගෙවීමේ ක්‍රමය.-*

වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් ගෙවීම් ගැණුම්කරු විසින් මා වෙත ගෙවිය යුතු ය.
සියලුම ගෙවීම් මුදලින් පමණක් කළ යුතු අතර, චෙක්පත් බාරගනු නොලැබේ.

01. සම්පූර්ණ ගැනුම් මුදලින් 25% එම ස්ථානයේ දී ම ගෙවිය යුතු ය.
02. ඉතිරි 75% ලිත් මසක් ඇතුළත ඉහත අංක දරන නඩුවට අදළව කොළඹ වාණිජ මහාධිකරණයේ තැන්පත් කළ යුතු ය.
03. රජයේ සහ වෙනත් ගාස්තු ගෙවිය යුතු ය.

රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය,
ඇඹිලිපිටිය.

වර්ෂ 2024 ක් වූ ජනවාරි මස 03 වැනි දින දී ය.

01-196

---

### කොළඹ වාණිජ මහාධිකරණයේ දී ය

### පිස්කල් මඟින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

එලායන්ස් ෆිනෑන්ස් කම්පැණි පී. එල්. සී.
අංක 84, වෝඩ් පෙදෙස, කොළඹ 07.

*නඩු අංකය* : CHC/CIVIL/129/20MR
*ඇස්කීසි අංකය* :
*ස්වභාවය* : උකස්
*ක්‍රියාපටිපාටිය* : සාමාන්‍ය
*වටිනාකම* : රු. 22,970,446.81

........................*පැමිණිලිකරු.*

*එදිරිව*

01. වසන්ත හේවා බඹරැන්ද ගමගේ,
අංක 115, චන්ද්‍රාවාස, පනාමුර පාර, උඩගම.

02. සුනේත්‍රා විජයනන්දනී සමරවීර,
අංක 115, චන්ද්‍රාවාස, පනාමුරපාර, උඩගම.

......................*විත්තිකරුවන්.*

කොළඹ වාණිජ මහාධිකරණයේ ඉහත අංක දරන නඩුවේ ඇතුළත් 2022 ක්වූ අප්‍රේල් මස 29 වැනි දිනැති තීන්දුව ප්‍රකාරව සමථ කොන්දේසි ඉදිරිපත් කිරීමට නියම කරන ලද අතර, ඒ අනුව පැමිණිල්ලේ ආයාචනයේ, පහත සඳහන් කොන්දේසි අනුව 1 වන විත්තිකරු විසින් ඇතුළත් කරන ලද සමථයට පත්කර ගැනීම සඳහා තීන්දු කර ඇත.

**01 වන විත්තිකරු විසින් පැමිණිලිකරුට :**

*(අ)* ඉහත විත්තිකරු පැමිණිලිකාර සමාගමට රුපියල් දෙකෝටි විසිනව ලක්ෂ හැත්තෑ දහස් හාරසිය හතලිස් හයයි ශත අසූ එකක (රු.22,970,446.81) මුදල හා ඒ මත පොළිය ගෙවීමට පැහැර හැර ඇති බවට හා එකී මුදල් ගෙවීමට බැඳී ඇති බවට නඩු තීන්දුවක් ලබාදෙන ලෙසත්,

*(ආ)* විත්තිකරු ඉහත රුපියල් දෙකෝටි විසි නව ලක්ෂ හැත්තෑදහස් හාරසිය හතලිස් හයයි ශත අසූ එකක (රු. 22,970,446.81) යන මුදල හා නෛතික පොළිය පියවීමේ සුරක්ෂිතයක් ලෙස පැමිණිලිකරු වෙත ලබා දී ඇති ඉහත ප්‍රසිද්ධ නොතාරිස් එච්. ආර්. ඊ. ගෝතමී හේරත් විසින් ලියා සහතික කරන ලද අංක 245 දරන උකස්කරය නීතිය ඉදිරියේ ක්‍රියාත්මක කර ගැනීම සඳහා නියෝගයක් ලබා දෙන ලෙසත්,

*(ඇ)* නඩු ගාස්තු ලබා දෙන ලෙසත්,

තව ද, විත්තිකරු මේ වන විට අප ආයතනය වෙත ගෙවා ඇත්තේ රුපියල් 1,040,000.00 ක මුදලක් පමණක් බැවින්, ඉතිරි මුදල ලබා ගැනීම සඳහා ඇස්කීසි ක්‍රියාත්මක කිරීමට ඇති බවය.

01. පැමිණිලිකරු විසින් පැමිණිල්ලේ ආයාචනයේ ඉල්ලා ඇති ආකාරයට පැමිණිලිකරුගේ වාසියට 01 වන විත්තිකරුට විරුද්ධව නඩු තීන්දුවක් සහ තීන්දු ප්‍රකාශයක් ඇතුළත් කිරීමට 01 වන විත්තිකරු එකඟ වන බවටත්,

02. කෙසේ වුව ද, 01 වන විත්තිකරු පහත සඳහන් අයුරින් රුපියල් දෙකෝටි විසිලක්ෂ හතලිස් එක්දහසක් (රු. 22,041,000.00) මුදලක් ගෙවනු ලැබුවහොත් නඩු තීන්දුව ඉටු කළාසේ සැලකීමට පැමිණිලිකරු එකඟ වන බවටත්,

03. පැමිණිලිකරු විසින් මෙකී සමථය ප්‍රකාරව 01 වන 02 වන විත්තිකරුවන්ට එරෙහිව පවතින එක් පාර්ශ්වික විභාගය ඉවත් කර ගැනීමට එකඟ වන බවටත්,

04. 01 වන විත්තිකරු ඉහත කී සමථය ප්‍රකාරව රුපියල් දෙකෝටි විසිලක්ෂ හතළිස් එක්දහසක (රු. 22,041,000.00) මුදලින් මූලික ගෙවීමක් වශයෙන් රුපියල් විසිලක්ෂ හතළිස් එක් දහසක (රු. 2,041,000.00) මුදලක් දැනටමත් පැමිණිලිකරු වෙත ගෙවා ඇති බවට පැමිණිලිකරු එකඟ වන බවටත්,

05. අනතුරුව සමථය ප්‍රකාරව ගෙවීමට ඉතිරි රුපියල් දෙකෝටියක (රු. 20,000,000.00) ක මුදල, මසකට රුපියල් එක් ලක්ෂය (රු. 100,000.00) බැගින් වූ එක සමාන මාසික වාරික 12 කින් ද, රුපියල් දෙලක්ෂයක (රු. 200,000.00) බැගින් වූ එක සමාන වාරික 12 කින් ද, රුපියල් තුන් ලක්ෂය (රු. 300,000.00) බැගින් වූ එක සමාන මාසික වාරික 12 කින් ද, රුපියල් හාරලක්ෂය (රු. 400,000.00) බැගින් වූ එක සමාන මාසික වාරික 12 කින් ද රුපියල් හයලක්ෂ හැටහයදහස් හයසිය හැට හතයි ශත දොළහක (රු. 666,667.12) බැගින් වූ එක සමාන මාසික වාරික 12කි න් ද, පැමිණිලිකරු වෙත ගෙවා නිම කිරීමට 01 වන විත්තිකරු එකඟ වන බවටත්,

06. රුපියල් එක් ලක්ෂයක් (රු. 100,000.00) වූ පළමු මාසික වාරිකය වර්ෂ 2022 ක් වූ මැයි මස 25 වැනි දින හෝ ඊට පෙර පැමිණිලිකරු වෙත ගෙවීමට ද, ඉන්පසු එළඹෙන සෑම වාරිකයක්ම සෑම මසකම 25 වැනි දින හෝ ඊට පෙර පැමිණිලිකරු වෙත ගෙවීමට ද 01 වන විත්තිකරු එකඟ වන බවටත්,

07. කෙසේ වුව ද, එකී සම්පූර්ණ සමථය වර්ෂ 2027 ක් වූ අප්‍රේල් මස 25 වැනි දින හෝ ඊට පෙර පැමිණිලිකරු වෙත ගෙවා අවසන් කිරීමට ද 01 වන විත්තිකරු එකඟ වන බවටත්,

08. 01 වන විත්තිකරු ඉහත කී ඕනෑම මාසික වාරික 02 ක් හෝ කිහිපයක් (එක ළඟ හෝ එක ළඟ නොවන) ගෙවීමට අපොහොසත් වුවහොත් හෝ පැහැර හැරියහොත් සහ/හෝ වර්ෂ 2027 ක් වූ අප්‍රේල් මස 25 වන දිනට හෝ ඊට පෙර ඉහත සඳහන් සම්පූර්ණ සමථ මුදල ගෙවීමට අපොහොසත් වුවහොත් හෝ පැහැර හැරියහොත් මෙම සමථය ප්‍රකාරව අද දින සිට යම්කිසි මුදලක් ගෙවා ඇත්නම් එම මුදල අඩු කර නඩුව තීන්දු කර ඇති සම්පූර්ණ මුදල ලබා ගැනීමට සහ ඇස්කීසි ලබා ගැනීමට පැමිණිලිකරුට අයිතියක් ඇති බවට 01 වන විත්තිකරු එකඟ වන බවටත්,

09. අවුරුද්දක කාලයක් ගත වුව ද, විත්තිකරුට විරුද්ධව කිසිදු නොතීසියක් නොමැතිව ඇසිකීසි ගැනීමට පැමිණිලිකරුට අයිතියක් ඇති බවට 01 වන විත්තිකරු එකඟ බන බවටත්,

10. එසේ ඇස්කීසි ගැනීමට සිදුවුවහොත් ඇස්කීසි ගැනීමේ සියළුම ගාස්තු සහ වියදම් 01 වන විත්තිකරු විසින් දැරිය යුතු බවට 01 වන විත්තිකරු එකඟ වන බවටත්,

11. 01 වන විත්තිකරු විසින් ඉහත කී සමථය ප්‍රකාරව ගෙවිය යුතු සම්පූර්ණ මුදල වන රුපියල් දෙකෝටි විසිලක්ෂ හතලිස් එක්දහසක (රු. 22,041,000.00) මුදල, වර්ෂ 2027 ක් වූ අප්‍රේල් මස 25 වන දින හෝ ඊට පෙර ගෙවා අවසන් කළ පසු,

(අ) මෙම නඩුවේ විෂයගත දේපළ සඳහා ලියාපදිංචි කර ඇති ලිස් පෙන්ඩනය අවලංගු කිරීමටත් මෙම නඩුව පවරා ඇති නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් එච්. ආර්. ඊ. ගෝතමී හේරත් විසින් ලියා සහතික කරන ලද අංක 245 සහ 2017.03.28 වන දින දරන ණය උකස්කරය අවලංගු කිරීමට සහ අවලංගු කළ ණය උකස්කරය 01 වන විත්තිකරු වෙත නැවත ලබා දීමට පැමිණිලිකරු එකඟ වන බවටත්,

12. මෙකී සමථය ප්‍රකාරව සියළු මුදල් ගෙවා නිම කිරීමෙන් පසුව ඉහත කී නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් එච්. ආර්. ටී. ගෝතමී හේරත් විසින් ලියා සහතික කරන ලද අංක 245 සහ 2017.03.28 වන දින දරන ණය උකස්කරයෙහි උපලේඛනයේ දක්වා ඇති දේපළ සම්බන්ධයෙන් කිසිඳු හිමිකමක් සහ/හෝ අයිතිවාසිකමක් ඉදිරිපත් නොකරන බවට පැමිණිලිකරු එකඟ වන බවටත්,

13. එකී සමථය ප්‍රකාරව 02 වන විත්තිකරුට එරෙහිව පියවර ගැනීමේ අයිතිය රඳවා තැබීමට පැමිණිලිකරු එකඟ වන බවටත් දන්වා තීන්දු ප්‍රකාශ කොට ඇත.

එකී තීන්දු ප්‍රකාශය අනුව ගෙවීම් කිරීමට 01 වන විත්තිකරු අපොහොසත් වී පැහැර හැර ඇති බැවින් එකී අධිකරණයෙන් මා වෙත ලැබී ඇති ඇස්කිසි බලපත්‍රයේ බලය පිට ඇඹිලිපිටිය දිසා අධිකරණ රෙජිස්ට්‍රාර්වරයා විසින් තහනමට ගෙන ඇති ඉහත නම් සඳහන් 01 වන විත්තිකරුට අයත් පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති නිශ්චල දේපළ,

වර්ෂ **2024** ක් වූ **පෙබරවාරි** මස **20** වන දින ප.ව. **12.30** ට ඉහත නම් සඳහන් 01 වන විත්තිකරුගේ උපලේඛනයේ සඳහන් නිශ්චල දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

### උපලේඛනය

සබරගමු පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කොලොන්න කෝරළේ, දියපොටගම් පත්තුවේ, ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් සහ ඇඹිලිපිටිය නගර සභා සීමාව තුළ උඩගම ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, ඇඹිලිපිටිය උඩගම ග්‍රාමයේ පිහිටි ''ජාහින්ගේ පංගුවෙන් කොටසක්'' නමැති ඉඩම බලයලත් මිනින්දෝරු එච්. එච්. ධර්මදාස මහතා විසින් මැන සාදන ලද අංක 5536 සහ 2017.02.16 දින දරන පිඹුර ප්‍රකාර ලොට් අංක 01 කැබැල්ලට මායිම් උතුරට : පාර ද, නැගෙනහිරට : මාදම්පේ සිට ඇති ඇඹිලිපිටිය දක්වා ඇති පාර ද, දකුණට: ඩබ්ලිව්. එස්. පියරත්න හිමිකම් කියන ඉඩම ද, ශ්‍රියානි හිමිකම් කියන ඉඩම සහ නලින් කිත්සිරි හිමිකම් කියන ඉඩම ද, බටහිරට : වයි. බී. ගුණසේකර හිමිකම් කියන ඉඩම ද, වයි. එම්. එස්. බණ්ඩාර හිමිකම් කියන ඉඩම සහ නලින්ද කිත්සිරි හිමිකම් කියන ඉඩම ද, යන මායිම් වූ ප්‍රමාණයෙන් රූඩ් දෙකයි පර්චස් හයයි දශම තුනයි තුනක (රූඩ් 2, පර්. 6.33) විශාලත්වය ඇති ඉඩම සහ ඒ තුළ පිහිටි, ගහකොළ සහ සියළු දේ ද වේ.

ඉහත කී ලොට් 01 කැබැල්ල මෙහි පහත විස්තර කෙරෙන ඉඩමෙන් නැවත මැන බෙදා වෙන් කර ගන්නා ලද්දකි. සබරගමු පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කොලොන්න කෝරළේ, දියපොටගම්, පත්තුවේ, ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් සහ ඇඹිලිපිටිය නගර සභා සීමාව තුළ උඩගම ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ ඇඹිලිපිටිය උඩගම ග්‍රාමයේ පිහිටි ''ජාහින්ගේ පංගුවෙන් කොටසක්'' නැමැති ඉඩම බලයලත් මිනින්දෝරු පී. ඩබ්. කේ. මනම්පේරි මහතා විසින් මැන සාදන ලද අංක 1244 සහ 2001.07.11 දින දරන පිඹුර ප්‍රකාර ලොට් අංක 01 කැබැල්ලට මායිම් උතුරට : මෙම ඉඩමේම තවත් කොටසක්, පිඹුරු අංක 1245 හි සඳහන් ඉඩම ද, නැගෙනහිරට : ප්‍රධාන පාරට වෙන් කර ඇති කොටස ද, දකුණට : කන්තෝරුවේ ගෙදර වත්ත ද, බටහිරට : කන්තෝරුවේ ගෙදර වත්ත සහ පිඹුරු අංක 1245 හි සඳහන් ඉඩමේ තවත් කොටසක් ද, යන මායිම් වූ ප්‍රමාණයෙන් රූඩ් තුනක (රූඩ් 3) විශාලත්වය ඇති ඉඩම සහ ඒ තුළ පිහිටි ගහකොළ සහ සියළු දේ ද වේ. (මෙය ඇඹිලිපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ L27/17 හි ලියාපදිංචි වී ඇත.)

*ගෙවීමේ ක්‍රමය.*- වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් ගෙවීම් ගැණුම්කරු විසින් මා වෙත ගෙවිය යුතුය.

සියලුම ගෙවීම් මුදලින් පමණක් කළ යුතු අතර චෙක්පත් භාරගනු නොලැබේ.

01. සම්පූර්ණ ගැණුම් මුදලින් 25 % එම ස්ථානයේ දී ම ගෙවිය යුතු ය.
02. ඉතිරි 75% ලිත් මසක් ඇතුලත ඉහත අංක දරන නඩුවට අදාළව කොළඹ වාණිජ මහාධිකරණයේ තැන්පත් කළ යුතු ය.
03. රජයේ සහ වෙනත් ගාස්තු ගෙවිය යුතු ය.

රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය,
ඇඹිලිපිටිය.

වර්ෂ 2024 ක් වූ ජනවාරි මස 03 වැනි දින දී ය.

01-195

## කුලියාපිටිය දිසා අධිකරණයේ දී ය

## සිවිල් නඩු විධාන සංග්‍රහයේ අංක 255 වැනි වගන්තිය යටතේ පිස්කල් විසින් කරනු ලබන පිස්කල් වෙන්දේසියේ විකිණීමයි

වර්ණකුලසූරිය මිරිසගේ ඉඳුනිල් මර්වින් රෙග්ලි ප්‍රනාන්දු,
රූපසිංහවත්ත, දුම්මලසූරිය.

.....................*පැමිණිලිකරු.*

*නඩු අංකය* : 424/MB
ස්වභාවය : උකස්
වටිනාකම : රු. 600,000/-
*ඇස්කීසි අංකය* : 98/2023

*එදිරිව*

ගනිහ ආරච්චිලාගේ ඉන්ද්‍රාණි පියසීලි මැණිකේ,
ගහලගස්වෙල, දුම්මලසූරිය.

......................*විත්තිකාරිය.*

ඉහත කී විත්තිකාරිය වෙත,

ඉහත අංක දරන නඩුවේ වර්ෂ 2019.08.02 වැනි දින ඇතුලත් කරන ලද තීන්දුව අනුව මා වෙත නිකුත් කර ඇති දේපළ තහනමට ගෙන විකිණීමේ ඇස්කීසියේ බලය පිට පැමිණිලිකරුට අයවිය යුතු රු. 600,000/- (රුපියල් ලක්ෂ හයක) මුදල ද, 2015.09.01 දින සිට තීන්දු ප්‍රකාශය ඇතුලත් කරන ලද 2019.08.02 දින දක්වා මාසිකව 5%ක පොළිය වශයෙන් රු. 1,410,000/- (රුපියල් දාහතරලක්ෂ දසදහස) ක් ද ඇතුළුව මුළු මුදල වශයෙන් රු. 2,010,000/- (රුපියල් විසිලක්ෂ දසදහස) ක මුදලක් විත්තිකාරිය විසින් පැමිණිලිකරුට ගෙවිය යුතු බවට නියෝග කොට ඇති හෙයින් ද, ඒ අනුව ඉහත නම සඳහන් විත්තිකාරියට අයත් මා විසින් දැනටමත් තහනමට ගෙන ඇති පහත උපලේඛනයේ සඳහන් වන නිශ්චල දේපල පිස්කල් වෙන්දේසියේ විකුණා පැමිණිලිකරුට එකී මුදල් අයකර දීම සඳහා මෙහි පහත උපලේඛනයේ සඳහන් දේපල,

**වර්ෂ 2024ක් වූ පෙබරවාරි මස 09 වැනි දින පෙරුවරු 11.00 ට** එකී දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### *උපලේඛනය*

01. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කටුගම්පල හත්පත්තුවේ, යගම්පත්තු කෝරලේ, උඩුබද්දාව, ප්‍රාදේශීය සභා බල සීමාව සහ බල සීමාවේ උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ගහලගස්වෙල ග්‍රාම නිලධාරි වසමට අයත්, ගහලගස්වෙල ගමේ පිහිටි ''පලුගහමුලවත්ත'' කියන ඉඩම් කොටස බලයලත් මිනින්දෝරු ඉරන්දතිස්ස කොටඹගේ මහතා විසින් 2005.11.13 වැනි දින මැන සාදන ලද අංක 1088/2005 දරන පිඹුරේ ප්‍රකාර මායිම,

උතුරට : බුදන්කුඹුර පන්සලට අයත් ඉඩම ද,
නැගෙනහිරට : නගර සභා පාර ද,
දකුණට : එස්. සුන්දරම්ට අයිති ඉඩම ද,
බස්නාහිරට : ඉන්ද්‍රානි පියසීලි යන අයගේ ඉඩම ද,

යන මායිම් තුළ පිහිටි පර්චස් දහඅට (පර්. 18) ක් විශාල ඉඩම සහ ඊට අයත් සියලු දේ ද වේ.

02. එකී ගහලගස්වෙල පිහිටි ''පලුගහමුලවත්ත'' කියන උතුරට : අංක 12 දරන ඉඩම ද, නැගෙනහිරට : යගම්වෙල ගම්කඩ ඉම ද, දකුණට සහ බස්නාහිරට : අංක 28 දරන ඉඩම ද, යන මායිම් තුළ පිහිටි පර්චස් 36ක් විශාල ඉඩමෙන් නොබෙදූ දෙකෙන් පංගුවෙන් නොබෙදූ දෙකෙන් පංගුවක් විශාල ඉඩමට වර්ෂ 2005.11.16 දින, අයි. කොටඹගේ බලයලත් මිනින්දෝරු තැන විසින් මැන සාදන ලද අංක 1089/2005 පිඹුරේ ලොට් 01 දරන,

උතුරට : බුදන්කුඹුර පන්සල ද,
නැගෙනහිරට : ඉහත කී පිඹුරේ ලොට් 02 ද, ලොට් 03 දරන අඩි 03ක් පළල පාර,
දකුණට : එස්. සුන්දරම්ට අයිති ඉඩම ද,
බස්නාහිරට : ප්‍රේමතිලක අප්පුහාමිගේ ඉඩම ද,

යන මායිම් තුළ පිහිටි පර්චස් 09 (පර්. 09) ක් විශාල ඉඩම සහ ඊට අයත් සෑම සියලු දේ ද වේ. තව ද, ඉහත කී අංක 1089/2005 දරන පිඹුරේ ලොට් 03 දරන අඩි 03ක් පළල පාර පාවිච්චි කිරීමේ අයිතිවාසිකම් ද සමග වේ.

පෙර ලියාපදිංචිය : A70/4, A11/124, A224/04

*දේපළ පිහිටීම.-*

කුලියාපිටිය සිට මාදම්පේ දක්වා දිවෙන මහා මාර්ගයට පැමිණ දුම්මලසූරිය නගරය දක්වා ගමන් කොට දුම්මලසූරිය නගරයෙන් යගම්වල පාරේ කිලෝමීටර් 03ක දුරක් යන විට බුදන්කුඹුර පන්සල හමුවේ. එකී පන්සල ඉදිරිපිට පාරේ අනිත් පස මෙම දේපළ පිහිටා ඇති අතර, එම ස්ථානයට පහසුවෙන් ප්‍රවේශ විය හැකිය.

*ගෙවීමේ ක්‍රමය.-*

වෙන්දේසිය අවසන් වූ වහාම සාර්ථක ගැනුම්කරු විසින්, (i) ගැනුම් මිලෙන් 25%ක් ද, (ii) සිවිල් නඩු විධාන සංග්‍රහයේ අංක 258 වගන්තිය ප්‍රකාරව පිස්කල් ගාස්තු ද, (iii) ප්‍රචාරණ වියදම්, පළාත් අධිකාරියේ බදු සඳහා 1%ක් ඇතුළු විකුණුම් සඳහා වන සියලු වියදම් ද මුදලින් ගෙවිය යුතු ය. තව ද, ගැනුම් මිලෙන් ඉතිරි 75%ක් වූ මුදල විකුණුම් දින සිට දින 30 (තිහක්) ඇතුළත එකී නඩුවේ බැරට අධිකරණයේ තැන්පත් කළ යුතු ය. නියමිත කාල සීමාව තුළ එකී 75%ක මුදල නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමටත් පැමිණිලිකරුට අයිතිය ඇත.

එස්. ඩී. එස්. ජයරත්න,
අතිරේක රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය - කුලියාපිටිය.

වර්ෂ 2024ක් වූ ජනවාරි මස 11 වැනි දින.

01-239

---

**බලංගොඩ දිසා අධිකණයේ දී ය**

**පිස්කල් විකිණීමයි**

*නඩු අංකය* : 5047/MB
*ඇස්කීසි අංකය* : 07/2020
*වටිනාකම* : රු. 5,984,532.92
*ස්වභාවය* : උකස්
*කාර්ය පටිපාටිය* : සාමාන්‍ය

කොළඹ 03, ගාලු පාරේ, අංක 450, දරන ස්ථානයේ ස්වකීය ලියාපදිංචි කාර්යාලය සහ අංක 84, බාන්ස් රත්වත්ත මාවත, බලංගොඩ යන ලිපිනයෙහි ''බලංගොඩ ශාඛාව''යනුවෙන් හඳුන්වනු ලබන ශාඛා කාර්යාලයක් පිහිටා ඇති පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පී. එල්. සී. (Pan Asia Banking Corporation PLC).

..................*පැමිණිලිකරු.*

*-එදිරිව-*

බමුණු ආරච්චිලාගේ චතුර සුදර්ශන ඥාණරත්න,
''දර්ශන''
ඇඩ්මෝවත්ත,
රත්මලවින්න,
බලංගොඩ.

.....................*විත්තිකරු.*

වර්ෂ 2018 ක් වූ සැප්තැම්බර් මස 19 වන දින බලංගොඩ දිසා අධිකරණයේ නඩු තීන්දුව අනුව පැමිණිලිකරුට ඉහත විත්තිකරුවන්ගෙන් අයකර ගැනීමට ඇති ණය පහසුකම් රුපියල් හත් ලක්ෂ හතලිස් දහස් අටසිය හැත්තෑ නවයයි ශත දාසය (රු.740,879.16) ක් වූ මුදලක් සහ එකී මුදල සම්පූර්ණයෙන් ගෙවනු ලබන තෙක් වර්ෂ 2017.03.30 වැනි දින සිට රු. 724,439.15 ක් වූ මුදල මත වර්ෂයකට 20% බැගින් වූ පොලියක් ද, රුපියල් අට ලක්ෂ පනස් අට දහස් පනස් අටයි ශත තිස් දෙක (රු. 858,058.32) ක් වූ මුදලක් සහ එකී මුදල සම්පූර්ණයෙන් ගෙවනු ලබන තෙක් වර්ෂ 2017.03.30 වැනි දින සිට රු. 802,119.38 ක් වූ මුදල මත වර්ෂයකට 20% බැගින් වූ පොලියක් ද, රුපියල් දාහතර ලක්ෂ අනූ හත් දහස් හයසිය දහයයි ශත අසූ හත (රු.1,497,610.87) ක් වූ මුදලක් සහ මුළුමුදල සම්පූර්ණයෙන්

ගෙවනු ලබන තෙක් වර්ෂ 2017.03.30 වන දින සිට රු. 1,412,035.56 ක් වූ මුදල මත වර්ෂයකට 18% බැගින් වූ පොළියක් ද, රුපියල් විසි අට ලක්ෂ අසූ හත් දහස් නවසිය අසූ හතරයි ශත පනස් හත (රු.2,887,984.57) ක මුදලක් සහ එකී මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමවන තෙක් වර්ෂ 2017.03.01 වැනි දින සිට රු. 2,887,984.57 ක මුදල මත වර්ෂයකට 18% බැගින් වූ පොළියක් ද පැමිණිලිකරුට ගෙවන ලෙස ද,

තව ද, ඉහත පැමිණිලිකරුට විත්තිකරුගෙන්, රුපියල් හත් ලක්ෂ හතලිස් දහස් අටසිය හැත්තෑ නවයයි ශත දාසය (රු. 740,879.16) ක් වූ මුදලක් සහ එකී මුදල සම්පූර්ණයෙන් ගෙවනු ලබන තෙක් වර්ෂ 2017.03.30 වැනි දින සිට රු. 724,439.15 ක් වූ මුදල මත වර්ෂයකට 20% බැගින් වූ පොළියක් ද, රුපියල් අට ලක්ෂ පනස් අට දහස් පනස් අටයි ශත තිස් දෙක (රු. 858,058.32) ක් වූ මුදලක් සහ එකී මුදල සම්පූර්ණයෙන් ගෙවනු ලබන තෙක් වර්ෂ 2017.03.30 වැනි දින සිට රු. 802,119.38 ක් වූ මුදල මත වර්ෂයකට 20% බැගින් වූ පොළියක් ද, රුපියල් දාහතර ලක්ෂ අනූ හත් දහස් හයසිය දහයයි ශත අසූ හත (රු. 1,497,610.87) ක් වූ මුදලක් සහ මුළු මුදල සම්පූර්ණයෙන් ගෙවනු ලබන තෙක් වර්ෂ 2017.03.30 වන දින සිට රු. 1,412,035.56 ක් වූ මුදල මත වර්ෂයකට 18% බැගින් වූ පොළියක් ද, රුපියල් විසි අට ලක්ෂ අසූ හත් දහස් නවසිය අසූ හතරයි ශත පනස් ශත (රු. 2,887,984.57) ක මුදලක් සහ එකී මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමවන තෙක් වර්ෂ 2017.03.01 වන දින සිට රු. 2,887,984.57 ක මුදල මත වර්ෂයකට 18% බැගින් වූ පොළියක් අය කර ගැනීම සඳහා මා විසින් තහනමට ගන්නා ලද අංක 7397, 2367 සහ 2481 දරන උකස් බැඳුම්කරයන්ගේ උපලේඛනවල සඳහන් නිශ්චල දේපළ, වර්ෂ **2024 ක් වූ පෙබරවාරි මස 21 දින පස්වරු 2.00 ට සහ පස්වරු 2.30** මා විසින් තහනමට ගන්නා ලද එම නිශ්චල දේපළයන් පිහිටි බලංගොඩ, රත්මලවින්න යන ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

## 1 වන උපලේඛනය

සබරගමු පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කඩවත කෝරළේ උඩුවග්ගම් පත්තුවේ ඉඹුල්පේ ප්‍රාදේශීය සභා සීමාවන් ඇතුළත, ඉඹුල්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇතුළත රත්මලවින්න ග්‍රාම නිලධාරී කොට්ඨාසය ඇතුළත, රත්මලවින්නෙහි පිහිටා ඇති ''දම්පිටිය මූකලාන'' *නොහොත්* වර්තමානයේ ''එඩ්මෝ එස්ටේට්'' නමින් හඳුන්වන ඉඩමට බලයලත් මිනින්දෝරු බී. විමලධර්ම විසින් සම්පාදිත වර්ෂ 2009.10.22 දිනැති අංක 1251 දරන පිඹුරෙහි ලොට් 1 ලෙස නිරූපිත බෙදා වෙන් කර ඇති ඉඩම් කැබැල්ලට මායිම් උතුරට : බලයලත් මානක ඒ. රට්නම් විසින් සම්පාදිත අංක 1050 පිඹුරෙහි නිරූපිත ඉඩම සහ එම්. ඒ. ගුණරත්න සහ තවත් අය විසින් හිමිකම් පානු ලැබූ ඉඩම, නැගෙනහිරට : එම්. ඒ. ගුණරත්න සහ තවත් අය විසින් හිමිකම් පානු ලැබූ ඉඩම සහ ආර්. එම්. තිලකරත්න විසින් හිමිකම් පානු ලබන ඉඩම සහ පාරෙන් ද, දකුණට : පාරෙන් සහ බස්නාහිරට : බලයලත් මානක ඒ. රට්නම් විසින් සම්පාදිත අංක 1050 පිඹුරෙහි නිරූපිත ඉඩමෙන් ද මායිම් වන ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් දාහතර (රූ. 1, පර්. 14) කින් ද සමන්විත යන ඉඩම සහ ගොඩනැගිලි වගාවන් සහ ඒ මත ඇති අනෙකුත් සියල්ල ද සමඟ වන ඉඩම් කැබැල්ල. මෙය රත්නපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම්/පත්‍රිරු D242/204 යටතේ ලියාපදිංචි කර ඇත.

එකී ඉඩම පහත දැක්වෙන ඉඩමෙන් ද බෙදා වෙන් කරන ලද්දකි.

ඉහත කී පරිදි රත්මලවින්නෙහි පිහිටා ඇති ''දම්පිටිය මූකලාන'' *නොහොත්* එඩ්මෝ එස්ටේට් හි කොටසක් නමැති ඉඩමට බලයලත් මානක ඒ. රට්නම් විසින් සම්පාදිත වර්ෂ 1984.04.28 දිනැති අංක 1052 දරන පිඹුරෙහි නිරූපිත බෙදා වෙන් කරන ලද ඉඩම් කැබැල්ලට මායිම් උතුරට : බලයලත් මානක ඒ. රත්නම් විසින් සම්පාදිත අංක 1050 පිඹුරෙහි නිරූපිත ඉඩම, නැගෙනහිරට: එම්. ඒ. ගුණරත්න, ඩබ්ලිව්. ආර්. පින්හාමි සහ එම්. ඒ. ජයවර්ධන විසින් හිමිකම් පාන ලද ඉඩම ද, දකුණට : එස්ටේට් පාර සහ බස්නාහිරට: බලයලත් මානක ඒ. රට්නම් විසින් සම්පාදිත අංක 1050 පිඹුරෙහි නිරූපිත ඉඩම මගින් ද මායිම් වන ප්‍රමාණයෙන් රූඩ් දෙක (රූ. 2) කින් ද සමන්විත වන සහ රත්නපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම්/පත්‍රිරු D242/177 යටතේ ලියාපදිංචි කර ඇති ඉඩම.

## 2 වන උපලේඛනය

සබරගමු පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කඩවත කෝරළේ උඩුවග්ගම් පත්තුවේ ඉඹුල්පේ ප්‍රාදේශීය සභා සීමාවන් ඇතුළත, ඉඹුල්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇතුළත රත්මලවින්න ග්‍රාම නිලධාරී කොට්ඨාසය ඇතුළත, රත්මලවින්නෙහි පිහිටා ඇති ''දම්පිටිය මූකලාන'' *නොහොත්* ''එඩ්මෝ එස්ටේට්'' නමින් හඳුන්වන ඉඩමට බලයලත් මිනින්දෝරු බන්දුසේන විමලධර්ම විසින් සම්පාදිත වර්ෂ 2016.03.15 දිනැති අංක 1769 දරන මිණුම් පිඹුරෙහි ලොට් 01 ලෙස නිරූපිත බෙදා වෙන් කර ඇති ඉඩම් කැබැල්ලට මායිම්, උතුරට : පාර සහ බලයලත් මානක ඒ. රට්නම් විසින් සකසන ලද අංක 193 පිඹුරෙහි ලොට් 3 ද, නැගෙනහිරට : ඇල ද, දකුණට : බලයලත් මානක බන්දුසේන විමලධර්ම විසින් සාදන ලද අංක 1724 පිඹුරෙහි නිරූපිත ඉඩම සහ බස්නාහිරට : බලයලත් මානක ජී. ආර්. එස්. ජයරත්න විසින් සකසන ලද අංක 257 ඒ දරන පිඹුරෙහි නිරූපිත ලොට් 01 ද, මායිම් වූ එකී අංක 1769 දරන පිඹුරට අනුව ප්‍රමාණයෙන් රූඩ් තුනයි පර්චස් තුන (රූ. 3. පර්. 3) කින් හෝ හෙක්ටයාර් 0.3111 කින් සමන්විත වූ ගොඩනැගිලි. ගහකොළ, වගාවන් සහ ඒ මත ඇති අනෙකුත් සියල්ල ද සමග වන මාර්ග අයිතිය ද සමග වන ඉඩම වේ.

එකී ලොට් 01 දරන ඉඩම පහත විස්තර කර ඇති ඉඩම්වල ඒකාබද්ධ කිරීමක් සහ අනු බෙදීමකි.

01. සබරගමු පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කඩවත කෝරලේ උඩුවග්ගම් පත්තුවේ ඉඹුල්පේ ප්‍රාදේශීය සභා සීමාවන් ඇතුළත, ඉඹුල්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇතුළත රත්මලවින්න ග්‍රාම නිලධාරී කොට්ඨාසය ඇතුළත, රත්මලවින්නෙහි පිහිටා ඇති ''දම්පිටිය මූකලාන'' *නොහොත්* ''එඩ්මෝ එස්ටේට් හි කොටසක්'' නමින් හඳුන්වන ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. එස්. පෙරේරා විසින් සාදන ලද වර්ෂ 1998.03.07 දිනැති අංක 493 දරන මිණුම් පිඹුරෙහි ලොට් 01 ලෙස සලකුණු කර ඇති බෙදා වෙන් කරන ලද ඉඩම් කැබැල්ලට මායිම්, උතුරට : පාර සහ බලයලත් මානක ඒ. රට්නම්ගේ අංක 193 හි පිඹුරෙහි නිරූපිත ලොට් 3 ද, නැගෙනහිරට : මාලදොළද, දකුණට : ලොට් 2, පාර සහ බස්නාහිරට : බලයලත් මානක පී. ආර්. එස්. ජයරත්න විසින් සකසන ලද අංක 257 ඒ පිඹුරෙහි නිරූපිත ලොට් 1 ද මගින් මායිම් වූ එකී අංක 493 දරන පිඹුරට අනුව ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් තිස් හතර (අ. 0, රූ. 1, පර්. 34) කින් *හෙවත්* හෙක්ටයාර් 0.1872 කින් සමන්විත වූ ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ ඒ මත ඇති අනෙකුත් සියල්ල ද සමඟ වන ඉඩම, මෙය රත්නපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම්/පත්ඉරු D308/22 යටතේ විධිමත්ව ලියාපදිංචි කර ඇති ඉඩම.

02. සබරගමු පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කඩවත කෝරලේ උඩුවග්ගම් පත්තුවේ ඉඹුල්පේ ප්‍රාදේශීය සභා සීමාවන් ඇතුළත, ඉඹුල්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇතුළත රත්මලවින්න ග්‍රාම නිලධාරී කොට්ඨාසය ඇතුළත, රත්මලවින්නෙහි පිහිටා ඇති ''දම්පිටිය මූකලාන'' *නොහොත්* ''එඩ්මෝ එස්ටේට් හි කොටසක්'' නමින් හඳුන්වන ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. එස්. පෙරේරා විසින් සාදන ලද වර්ෂ 1998.03.07 දිනැති අංක 493 දරන මිනුම් පිඹුරෙහි ලොට් 01 ලෙස සලකුණු කර ඇති බෙදා වෙන් කරන ලද ඉඩම් කැබැල්ලට මායිම්, උතුරට : ලොට් 01 ද, නැගෙනහිරට : කාණුව ද, දකුණට : පාර සහ බස්නාහිරට : පාර ද මගින් මායිම් වූ එකී අංක 493 දරන පිඹුරට අනුව ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් තිස් හතර (රූ. 01, පර්. 34) කින් *හෙවත්* හෙක්ටයාර 0.1872 කින් සමන්විත වූ ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ ඒ මත ඇති අනෙකුත් සියල්ල ද සමග වන ඉඩම. මෙය රත්නපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම්/පත්ඉරු D294/66 යටතේ විධිමත්ව ලියාපදිංචි කර ඇති ඉඩම.

ඒ. ඩී. සුරවීර,
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය, බලංගොඩ.

වර්ෂ 2024 ක් වූ ජනවාරි මස 02 වැනි දින දී ය.

01-220

---

# විවිධ දැන්වීම්

**ස්වකීය සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරමින් කොළඹදී පවත්වනු ලබන බස්නාහිර පළාතේ මහාධිකරණයේ දී ය.**

ගණන් බේරා වසා දැමීමේ නිවේදනය

ස්වකීය ලියාපදිංචි කාර්යාලය වාද්දුව, පොහොද්දරමුල්ල, වෙරළ පාරේ පිහිටා ඇති EM හොටෙල්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් යන ආයතනය ගණන් බේරා වසා දැමීම සඳහා වූ කාරණයේ දී ය.

*නඩු අංකය* : CHC 102/2023/CO
*ස්වභාවය* : සමාගම් (ගණන් බේරා වසා දැමීම)

ලිමිටෝන් ග්ලෝබල් ලිමිටඩ්,
OMC චෙම්බර්ස් විකම්ස් කේ 1, රෝඩ් ටවුන්,
ටොරාටෝලා,
බ්‍රිටිෂ් වර්ජින් අයිලන්ඩ්.

(Limitone Global LTD,
of OMC Chambers, Wickhams Cay 1, Road Town, Tortola,
British Virgin Islands.)

..........................*පෙත්සම්කරු.*

ඉහත නම් සඳහන් සමාගම ගණන් හිලවු බේරා වසා දැමීම සඳහා සිය සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරමින් කොළඹ දී පවත්වනු ලබන බස්නාහිර පළාතේ මහාධිකරණය වෙත 2023 දෙසැම්බර් මස 08 වැනි දින පෙත්සමක් ඉදිරිපත් කරන ලද බවත් එම පෙත්සම

2024 මාර්තු මස 25 වැනි දින අධිකරණය ඉදිරියේදී ඇසීමට නියම කර ඇති බවත් මෙයින් නිවේදනය කරනු ලැබේ. එම පෙත්සම පිළිබඳව නියෝගයක් ලබාදීමට කැමති හෝ ඊට විරුද්ධ වන ඕනෑම ණය හිමියෙකුට හෝ එකී සමාගමෙහි දායකයකුට නඩුව කැඳවන අවස්ථාවේ දී පුද්ගලිකව හෝ සිය නීතිඥවරයා මාර්ගයෙන් පෙනී සිටිය හැකි අතර, පෙත්සමෙහි පිටපතක් එය අවශ්‍ය කෙරෙන ඕනෑම ණය හිමියෙකුට හෝ එකී සමාගමෙහි දායකයෙකු වෙත ඒ සඳහා වන නියමිත ගාස්තු ගෙවීමෙන් පසුව පහත අත්සන් තබා ඇති අය විසින් ලබාදෙනු ඇත.

*අත්සන් කළේ* : කේ. එච්. පී. දනුක්ෂිකා ප්‍රියදර්ශනී,
පෙත්සම්කරුගේ නීතිඥ,
අංක 166/1, අළුත්කඩේ වීදිය, කොළඹ 12.

***සටහන*** : එකී පෙත්සම අඩගසනු ලබන අවස්ථාවට පෙනී සිටීමට කැමැත්තක් දක්වන ඕනෑම පුද්ගලයෙකුට ඔහු එසේ කැමැත්තෙන් සිටින බව ඉහත නම් සඳහන් පෙත්සම්කරුගේ නීතිඥවරයා වෙත ලිඛිතව තැපෑලෙන් දැන්විය යුතුය. *නැතහොත්* ගෙනැවිත් භාරදිය යුතුය. එම නිවේදනයෙහි පුද්ගලයාගේ නම ලිපිනය සහතික කළ යුතුය. එසේ *නැතහොත්* තම නීතිඥවරයා (සිටී නම්) මාර්ගයෙන් භාරදිය යුතු ය. තැපෑලෙන් එවනු ලබන්නේ නම් 2024 මාර්තු මස 24 වැනි දින පස්වරු 6.00 ට පෙර ඉහත නම් සඳහන් අය වෙත ලැබෙන පරිදි එවිය යුතුය.

01-172

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.